සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

## නාට්‍ය හා රංග කලාව

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- පහත දැක්වෙන තොරතුරු ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

A. දෙමාපියන් දූ දරුවන් - නාමෙට පින් පමුණුවන්න
මළගිය ඇත්තන් වෙනුවෙන් - පිනට මුකුත් මට ලැබෙන්න

B. සුරුට්ටු ද බොන්නෙ - බුලත් ම ද කන්නේ
හෙනං ගෙන එන්න සුරුට්ටුව බොන්න

C. මට දවල් වෙනකම් බුදිය ගන්න ඕන
එසේය මහරජතුමනි

D. කෝ මෙතන තිබුණු රෝස පඳුර
මම කපල දැම්මා
ඒ ඇයි?

E. වනේ සිදඹුවෝ - කඩා මල්පෙති
වරල සරසා - ගනිති නිතිනා

01. හෙන්රි ජයසේන නිර්මාණකරුවාගේ නිර්මාණයකි,
(i) A (ii) B (iii) C (iv) D

02. සුභ සහ යස නාට්‍යයට අයත් සංවාද කාණ්ඩයකි.
(i) C (ii) D (iii) A (iv) B

03. නාට්‍ය ධර්මී ශෛලීයට අයත් නාට්‍යයක සංවාද / පද්‍ය කාණ්ඩ වේ.
(i) D (ii) E (iii) B (iv) A

04. මහාචාර්ය ඉදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යකට අයත් සංවාද / පද්‍ය කාණ්ඩයකි.
(i) B, C (ii) C, D (iii) A, E (iv) D, B

05. නරිබෑනා නාට්‍යයට අයත් සංවාද කාණ්ඩයකි.
(i) D (ii) E (iii) B (iv) A

- පහත දැක්වෙන තොරතුරු ඇසුරින් අංක 06 සිට 08 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

E - දහඩිය දැමීම F - වේෂ භූෂණ G - රංගාලෝකය
H - අංගරචනය I - සිරුර දරදඬු වීම J - උරහිස
K - මැණික් කටුව L - සංවාද M - විලුඹ
N - දෙබස් O - රෝමෝද්ගමනය P - ගීත

06. සාත්වික අභිනය හා සම්බන්ධ වේ.
(i) E, K, C (ii) E, I, O (iii) N, M, H (iv) O, P, G

07. ආහාර්ය අභිනය හා සම්බන්ධ වේ.
(i) F, G, H (ii) K, N, F (iii) J, N, M (iv) I, L, N

08. වාචික අභිනයට අයත් වේ.
(i) N, O, H (ii) F, G, H (iii) L, N, P (iv) J, G, K

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අදින්න.

09. සරා, තේගිරිස්, දියෝනිස් යන චරිත ත්‍රිත්වය ඇතුළත් නාට්‍යය වන්නේ,
(i) දැස නිසා ය. (ii) දේවතා එළි ය. (iii) මූදු පුත්තු ය. (iv) සුභ සහ යස ය.

10. ලෝක ධර්මි නාට්‍යය ඇතුළත් වරණය වන්නේ,
(i) තට්ටු ගෙවල්, මනමේ (ii) කැලණිපාලම, රත්තරන්
(iii) කැළණි පාලම, අහසින් වැටුණු මිනිස්සු (iv) සිංහබාහු, කදා වළලු

- පහත දැක්වෙන ඡායාරූප ඇසුරින් 11 සිට 15 දක්වා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


A


B


C


D


E

11. සිංහබාහු නාට්‍යයේ සුප්පාදේවියගේ චරිතය නිරූපණය කරනු ලැබුවේ,
(i) D (ii) C (iii) B (iv) A

12. රත්තරන් නාට්‍යයේ මැහැල්ලගේ චරිතය රඟපෑ ශිල්පිනිය වන්නේ,
(i) B (ii) E (iii) A (iv) C

13. මෝදර මෝල හා හිරු නැති ලොව නාට්‍යවල නිෂ්පාදකවරයා වන්නේ,
(i) C (ii) D (iii) A (iv) E

14. දසක තුනකට අධික කාලයක් සිංහබාහු චරිතය රඟ පෑ ශිල්පියා වනුයේ,
(i) D (ii) E (iii) C (iv) B

15. කදා වළලු නාට්‍යයේ නිෂ්පාදකවරයා වන්නේ,
(i) A (ii) C (iii) D (iv) E

- හිස්තැනට අදාළ පිළිතුර ලියා දක්වන්න.

16. මනමේ සිංහබාහු නාට්‍ය ...................................... ශෛලියට අයත් වේ.

17. බෞද්ධ පූජාකර්ම වල රජ කෙනෙකුගේ චරිතයට සමාරෝපය වී ඇත්තේ .................................. පූජා කර්මයේය.

18. නාට්‍ය පිටපතක වරහන් තුළ ......................................... දක්නට ලැබෙයි.

19. කටහඬ අභ්‍යාස කරවීම සඳහා භාවිතා කළ හැකි පැරණි ග්‍රන්ථයක් ලෙස .................................. හැඳින්විය හැකි ය.

20. චරිතයක විවිධ පැතිකඩ .................................. නමින් හඳුන්වයි.

(ලකුණු 1×20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළත් ව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

- 01) **පහත දැක්වෙන සංවාද කාණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

"..... (බැගපත් ලීලාවෙන්) ..... අනේ තරහ වෙන්න එපා.
මේ ළමයා කියන එකක් අහන්නේ නෑ
කාටවත් වැඩක් නෑ ඔය තලියෙන් .....
(තලිය තද කොට) මේක මේ ගෙදරම තිබ්බ්ච තලියක් ද?
ඔව් මේ දුමේ දාලා තිබිලා හොඳටම කළුත් ගැහිලා"

i. ඉහත සංවාදය ඇතුළත් නාට්‍යය හා නිෂ්පාදකවරයා කවුද?
ii. එම නාට්‍යයේ කතා පුවත දක්නට ලැබෙන ජාතක කතාව කුමක් ද?
iii. සංවාද කාණ්ඩයේ දක්නට ලැබෙන රංග විධානයක් ලියන්න.
iv. ඉහත සංවාද කාණ්ඩය පවසන්නේ කවුරුද? කාහටද?
v. මෙම නාට්‍යයේ දක්නට ලැබෙන චරිත මොනවා ද? (ලකුණු 5×2 = 10)

02) i. "ගැමි නාට්‍ය කලාව" කෘතිය රචනා කළේ කවුද? (ලකුණු 2)
ii. එම රචකයාගේ නාට්‍ය, අංශ හතරක් යටතේ වර්ග කර ඇත. ඒ මොනවා ද? (ලකුණු 2)
iii. ඉහත දැක්වූ නාට්‍ය වර්ග හතරට උදාහරණ දෙක බැගින් ලියා දක්වන්න. (ලකුණු 6)

03) රූපකාර්යය සඳහා සතර අභිනය ඉතා වැදගත් වේ.
i. සතර අභිනය නම් කරන්න. (ල 2)
ii. රූපණයේ දී අභ්‍යන්තර මනෝභාවයන් මුහුණින් ප්‍රකාශ කරන අභිනය හඳුන්වන නම කුමක්ද? (ල 2)
iii. එම අභිනය නළු කාර්ය සඳහා යොදා ගන්නා ආකාරය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ල 6)

04) i. රංග අභ්‍යාස යනු මොනවාද? (ලකුණු 2)
ii. රංග අභ්‍යාස හතරක් නම් කරන්න. (ලකුණු 2)
iii. රංග අභ්‍යාසයක් සිදුකරන ආකාරය ලියා දක්වන්න. (ලකුණු 6)

05) i. නාට්‍ය පෙළ යනු කුමක්ද?
ii. නාට්‍ය පෙළක අන්තර්ගත ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)
iii. පහත දැක්වෙන තේමාවන් ඇසුරින් ඔබ කැමති තේමාවක් ඔස්සේ නාට්‍යය පෙළක් ගොඩනගන්න.
- සිටියොත් හොඳට හැදී දෙවියොත් නමට වදී.
- උත්සාහවන්තයා ජය ගනී.
- මවුපිය සෙනෙහස අසීමිතය. (ලකුණු 6)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

## නාට්‍ය හා රංග කලාව

### ප්‍රායෝගික පරීක්ෂණය

- **පහත දැක්වෙන ප්‍රායෝගික ක්‍රියාකරකම් සිදුකර එක් අංගයකට ලකුණු 10 බැගින් ලබා දෙන්න.**

01) නාට්‍ය ගීතයක් (රංගනය සමග) (ලකුණු 15)

02) කදා වළලු නාට්‍යයෙන් සිසුවාගේ අභිමතය පරිදි තෝරා ගත් සංවාද කාණ්ඩයක් (ලකුණු 10)

03) එකම වචනය අර්ථ තුනක් ලැබෙන ආකාරයට උච්චාරණය කිරීම.
(ගුරුවරයාට අභිමත පරිදි උච්චාරණය කිරීම සඳහා අවශ්‍ය වචනය ලබා දිය යුතුය) (ලකුණු 10)

04) පහත දැක්වෙන චරිත රංගනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- හමුදා නිලධාරියෙක්
- හිඟන්නා
- ශාස්ත්‍රකරුවෙක් / කාරියක්
- නර්තන ශිල්පියෙක් / ශිල්පිනියක්
- නිවේදකයෙක් හෝ නිවේදිකාවක්

(මීට අමතරව වෙනත් චරිත යොදා ගැනීමට ගුරුවරයාට අවස්ථාව ඇත.) (ලකුණු 10)

05) කණ්ඩායමක් ලෙස නාට්‍යයක් රඟ දක්වා පෙන්වීම.
(ළමුන්ට අභිමත පරිදි ගොඩනගා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.) (ලකුණු 10)